(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 24]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2008 සැප්තැම්බර් මස 24 වැනි බදාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0068/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වසර පහක කාලය සඳහා —

(i) රජය විසින් ඖෂධ මිලට ගැනීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) එම වෙන් කරනු ලැබූ මුදලින් වැය කරනු ලැබූ මුදල කොපමණද;

(iii) වසර 1-2 කාලයක් සඳහා රජය විසින් ගෙවිය යුතු මුදල් ගෙවා නැතැයි බොහෝ සමාගම් පැමිණිලි කර ඇති බව සත්‍යයක්ද;

(iv) ගෙවිය යුතුව ඇති මුදල සහ හේතුව පිළිබඳව කාලය අනුව සිදු කළ විශ්ලේෂණයක්ද සහිත විස්තරයක් කවර ආකාරයක් වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රජය විසින් එලෙස මුදල් ගෙවිය යුතුව ඇති සමාගම්වල නම් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඖෂධ සැපයූ සමාගම්වලට පළාත් සෞඛ්‍ය අධිකාරිය විසින් ගෙවිය යුතුව ඇති මුදල කොපමණද;

(ii) ඔවුන් මධ්‍යම රජය වෙත ගෙවිය යුතුව ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0069/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005, 2006 සහ 2007 යන වර්ෂ සඳහා —

(i) අධ්‍යාපනය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) පෙළ පොත් මුද්‍රණය කිරීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 5 තුළ රජයට පෙළ පොත් සහ අභ්‍යාස පොත් සපයන්නන් සහ මුද්‍රණකරුවන් වෙත ගෙවීමට සිදු වූ මුදල් ප්‍රමාණයන් සහිත ලේඛනයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) රජය ඔවුන් වෙත ගෙවීමට තිබූ මුදල් නොගෙවීම නිසා සැපයුම්කරුවන් බොහෝ දෙනෙක් බංකොලොත්භාවයට හෝ මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටින බව එතුමා දන්නෙහිද?

(ඈ) ඔවුන්ට මුදල් ගෙවනු ලබන්නේ කෙදිනකද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0070/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005, 2006 සහ 2007 වර්ෂ තුළ මහාමාර්ග, මාර්ග හා අධිවේගී මාර්ග සඳහා ප්‍රතිපාදනය කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) දැනටමත් ආරම්භ කරනු ලැබ ඇති, අඩක් නිම කරන ලද හෝ සම්පූර්ණ කරන ලද වැඩ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරුවන්ට සහ සැපයුම්කරුවන්ට පසුගිය වර්ෂ 05ක කාලය තුළ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) ඔවුන්ට මුදල් ගෙවනු ලබන දිනය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "මග නැගුම" සහ මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) සහායක ආයතන ඈවරකරණය කිරීමට නියමිතව ඇති බව සත්‍යයක්ද;

(ii) එසේ නම් සැපයුම්කරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ගෙවනු ලබන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0162/'08

4.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින් , ලුනාව පරිසර හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1230 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර වැඩ කටයුතු සඳහා ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0163/'08

5.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින් , ජාතික භෞතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ පූජාභූමි සංවර්ධනය සඳහා රුපියල් මිලියන 274 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0164/'08

6.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ පාරිභෝගික නිලධාරී තනතුර සඳහා 2007.01.11 වැනි දින දෙවැනි සම්මුඛ පරීක්ෂණය පැවැත් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සම්මුඛ පරීක්ෂණයට කැඳවූ සංඛ්‍යාව හා 2007.01.11 වැනි දිනට පැවති තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) තනතුරු සංඛ්‍යාව වැඩිකිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය ඉල්ලා සිටියේ නම් අදාළ සංඛ්‍යාව හා දිනය කවරේද;

(iii) 2007.01.11 වැනි දින සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ අයගේ නම, ලිපිනය, ලබාගත් ලකුණු වෙන් වෙන්ව කවරේද;

(iv) දෙවැනි සම්මුඛ පරීක්ෂණයේ දී කුසලතා පදනමින් තෝරාගත් අයට පත්වීම් ලබානොදීමට හේතුව කවරේද;

(v) මැයි මස 07 වැනි දින තවත් දෙවැනි සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට හේතුව කවරේද;

(vi) මේ සඳහා 2007.01.11 වැනි දින නොකැඳවූ අය කැඳවා තිබේනම් ඊට හේතුව කවරේද;

(vii) ඔවුන්ගේ නම, ලිපිනය සහ ලබාගත් ලකුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2007.01.11 වැනි දින පැවති සම්මුඛ පරීක්ෂණයේ දී 5 වැනි ස්ථානයට පසුපසින් සිටි සංචාරක මණ්ඩලයේ ජාතික සේවක සංගමයේ හිටපු සභාපතිවරයාගේ දියණිය වන එම්. එන්. ද අල්විස් යන අය 2007.05.07 වැනි දින පැවති සම්මුඛ පරීක්ෂණයෙන් ඉදිරියට ගෙන පත්වීම් ලබාදී ඇති බවත්;

(ii) මෙහිදී ජයප්‍රියා ආදිහෙට්ටි යන අය ඉවත්කිරීම මගින් සුදුසුකම් ලැබූ අයට අසාධාරණයක් වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) මෙම තත්වය නිවැරදි කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0363/'08

7.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නාවලපිටිය - දෙනිඳ - අංක 87/3, ලිපිනයෙහි පදිංචි ආර්. එම්. දිලානි රත්නායක නමැති අය 2003.09.30 වැනි දින සිට දෙනිඳ උප තැපැල් කාර්යාලයේ පූර්ණ කාලීන ලියාපදිංචි ආදේශිකාවක් ලෙස සේවය කරන බව එතුමා දන්නෙහිද?

(ආ) දෙනිඳ උප තැපැල් ස්ථානාධිපතිනියට 2006.07.31 වැනි දින සිට උසස්වීමක් ලැබීම නිසා, එම තනතුර පුරප්පාඩුවූ අතර එම පුරප්පාඩුවට ස්ථිර ආදේශිකාව පත්කිරීම සාමාන්‍යයෙන් සිදුවන දෙයක් වුවද, දිලානි රත්නායක නමැත්තිය එම පුරප්පාඩුවට පත් නොකළේ කවර හේතුවක් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එහෙත් 2007.09.15 වැනි දින සිට එම උප තැපැල් කාර්යාලයේ ආදේශකයෙක් ලෙස හෝ කටයුතු නොකළ සිසිර කුමාර බණ්ඩාර යන අය එම පුරප්පාඩුවට පත්කිරීම සාධාරණ නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) සුදුසුකම් හා පලපුරුද්ද මත දිලානි රත්නායක නමැති අය දෙනිඳ උප තැපැල් ස්ථානාධිපති තනතුරට පත් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0364/'08

8.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බටපොල, පොල්දූව, අංක 158/1 ලිපිනයෙහි පදිංචි ආර්. ජී. විමලසූරිය මහතා 1978 මාර්තු මස 01 වැනි දින සිට ලංකා ගමනාගමන මණ්ඩලයේ ගාල්ල ඩිපෝවේ සේවය කළ බවත්;

(ii) වයස අවුරුදු 53 සම්පූර්ණවීම මත 2006 මාර්තු මස 25 වැනි දින විශ්‍රාම ගන්වන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/2002 දරන 2002.08.23 දිනැති චක්‍රලේඛය අනුව අවුරුදු 57 දක්වා සේවය දීර්ඝ කර ගැනීමට අවස්ථාව තිබියදි, සේවා දිගුවක් ඉල්ලා සිටි මොහු විශ්‍රාම යැවුයේ කවර හේතුවක් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වයස අවුරුදු 57 දක්වා සේවය කිරිමට ඔහුට සේවා දිගුවක් ලබා දෙන්නේද;

(ii) අසාධාරණයට ලක්වූ කාල සීමාවට හිඟ වැටුප් හා දීමනා ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0367/'08

9.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර, කාලිදාස පාර, අංක 13/11 ඒ ලිපිනයෙහි පදිංචි එච්. එස්. වික්‍රමආරච්චි මහත්මිය මාතර මහජන බැංකුවේ ප්‍රාදේශීය කළමනාකාර කාර්යාලයේ රහස්‍ය ලේකම් ලෙස සේවය කළ බවත්;

(ii) ඇය 2007.10.14 වැනි දින සිට විශ්‍රාම ගන්වා ඇති බවත්;

(iii) සේවක චක්‍රලේඛ අංක 323/2001 විධිවිධාන පරිදි 2007.10.14 වැනි දින සිට 2008.10.14 වැනි දින දක්වා සේවා දිගුවක් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඇයගේ බැංකු සේවා කාලය කොපමණද;

(ii) වාර්ෂික වැටුප් වර්ධක දිනය කවදාද;

(iii) ඇය එක්රැස් කළ වරප්‍රසාද නිවාඩු දින ගණන සහ එක්රැස් කළ අසනීප නිවාඩු දින ගණන කොපමණද;

(iv) ඇය සේවා දිගුවක් ඉල්ලා තිබියදීත්, වැටුප් වර්ධක දිනය පවා පසුකිරීමට ඉඩනොදී 2007.10.14 වැනි දින සිට විශ්‍රාම ගැන්වූයේ කවර හේතුවක් නිසාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඇයට නියමිත සේවා දිගු ලබාදීමටත්, අසාධාරණයට ලක්වූ කාල සීමාවට වැටුප් හා අනිකුත් දීමනා ලබාදීමටත් එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0638/'08

10.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,—ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) රජයට අයත්ව තිබූ හෝමදොල වතුයායේ ඉහළ හෝමදොල කොටස නො.2 සහ අක්කර 80 ඉඩම්, වටවල වැවිලි සමාගමට බදු පදනම මත ලබාදෙන විට තිබූ අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) වටවල වැවිලි සමාගමට බදු දීමෙන් අනතුරුව 2007 දෙසැම්බර් වන විට ගම් පුළුල් කිරීම හෝ අනවසර නියමානුකූල කිරීම යටතේ ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ රජයට ලබාදීමෙන් පසු ඉතිරි ඉඩම්වල මායිම් නිරවුල් ව පවත්වාගෙන තිබේද;

(iv) මායිම් නිරවුල්ව පවත්වා නොගැනීම නිසා ඇති වන අනවසර අත්පත්කර ගැනීම් වැළැක්වීමට ගනුලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) (i) හෝමදොල වතුයායට මායිම්ව ඉහත ප්‍රදේශවල පෞද්ගලික වතු තිබේ නම් ඒ කවරේද;

(ii) එම පෞද්ගලික ඉඩම් හිමියන් ඉහත වතුයායේ ඉඩම් අත්පත් කරගෙන තිබේද;

(iii) එසේ නම් එම ඉඩම් නැවත වතු සමාගමට පවරා ගැනීම කොපමණ කාලසීමාවක් තුළ සිදුකරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0639/'08

11.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) ගාල්ල, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්නලිය රක්ෂිතයට මායිම්ව සහ අක්කර 750 ඉඩම්වලට යාබද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කොතලාවල ප්‍රදේශයේ ඇති ඉඩම්වල මායිම් මැන සලකුණුකර තිබේද;

(ii) එසේනම් ඒ කවර වර්ෂයේද;

(iii) රක්ෂිතයට මායිම් ව පෞද්ගලික වතු තිබේ නම් ඒ කවරේද;

(iv) එම ඉඩම් ප්‍රමාණයන් කොපමණද;

(v) මායිම් වෙන් කිරීමෙන් අනතුරුව යළිත් එම ඉඩම් අනවසරයෙන් අත්පත්කර ගැනීමක් සිදුව තිබේද;

(vi) එසේ නම් ඔවුන් හඳුනාගෙන නෛතික පියවර ගෙන තිබේද;

(vii) ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රජයට අයත් රක්ෂිත ලෙස තැබිය යුතු ඉහත ඉඩම් මේ වන විටත් මහා පරිමාණ ඉඩම් හිමියන් විසින් අනවසරයෙන් අත්පත් කරගැනීම සිදුකරන බව එතුමා දන්නෙහිද?

(ඇ) රජයට අයත් වටිනා වන සම්පත ආරක්ෂා කරගැනීම සඳහා මේ වන විට ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0640/'08

12\.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බොරැල්ල දේශීය වෛද්‍ය විද්‍යාලය, ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යාලය සහ යාපනය දේශීය වෛද්‍ය විද්‍යාලය සඳහා 1990 වර්ෂයේ සිට වාර්ෂිකව ආයුර්වේද, සිද්ධ සහ යුනානි පාඨමාලා සඳහා බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) 1990 වර්ෂයේ සිට වෛද්‍ය විද්‍යාල වලින් උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් ලෙස සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(ii) දේශීය වෛද්‍ය විද්‍යාලවලට ශිෂ්‍යයන් බඳවා ගනු ලබන්නේ ජාතික වශයෙන් අවශ්‍යතාවයන් හඳුනාගෙනද නැතහොත් තිබෙන සීමිත ඉඩකඩ සැලකිල්ලට ගෙනද;

(iii) 2007 වර්ෂයේ දී ඉහත වෛද්‍ය විද්‍යාල වලින් උපාධිය සමත් වූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0669/'08

13\.

ගරු සමන්සිරි හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නවගත්තේගම, නො. 40, වෙලේවැව ලිපිනයෙහි පදිංචි (පොලිස් කොස්තාපල් 31746) එම්. ඒ. එස්. ශාන්ත යන අය 1989.06.15 වැනි දින සිට නිත්‍ය සේවයේ පොලිස් කොස්තාපල් වරයෙක් වශයෙන් සේවයට බැඳුණු බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වෙන්නප්පුව පොලිස් පුහුණු අභ්‍යාස විද්‍යාලයට අනුයුක්තව පුහුණුව ලබමින් සිටියදී ඔහුගේ පත්වීම අවලංගු කිරීමට හේතු කවරේද;

(ii) නැවත 1992.04.10 වැනි දින සිට ඔහු සේවයේ පිහිටවූයේ පෙර අවලංගු කළ පත්වීම යුක්ති සහගත නොවන නිසාද;

(iii) අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගයකට අනුව අවුරුදු 16කට වැඩි කාලයක් පොලිස් සේවයේ උසස්වීම් නොලද අයට උසස්වීම් ලබාදීමේ තීරණයට අනුව 2006.02.23 වැනි දින සිට පොලිස් සැරයන් තනතුරට උසස්වීම් ලද මොහු, 2006.04.16 වැනි දින සිට තනතුරින් පහත හෙලන ලද්දේ කවර හේතුවක් නිසාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශාන්ත මහතාට එරෙහිව විනය කඩකිරීමක් හෝ චෝදනාවක් තිබේ නම් ඒ කවරේද;

(ii) 1989.06.15 වැනි දින සිට මොහුගේ පත්වීම පොලිස් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබියදී, ඉහත උසස්වීම් ලබා දීමේදී 1992.08.01 වැනි දින සිට ඔහුගේ සේවා කාලය ගණනය කිරීම සිදුවූයේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) ශාන්ත මහතාට සාධාරණය ඉටු කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0671/'08

14.

ගරු සමන්සිරි හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ගවලට අයත් සමස්ත වැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වැව් වලට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන්ව කොපමණද;

(iii) මෙම රක්ෂිත ඉඩම් හඳුනා ගැනීම සඳහා අවසන්වරට මිනුම් කටයුතු කර ඇති වර්ෂය කවරේද;

(iv) රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන් සිටීද;

(v) එසේනම්, ඔවුන් පදිංචි ව සිටින්නේ කිසියම් නෛතික තත්ත්වයක් තුළද;

(vi) අදාළ වර්ෂය, පදනම සහ කොපමණ කාලසීමාවක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සුළු වාරිමාර්ග හා මහ වාරිමාර්ග අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වැව් රක්ෂිතවල පදිංචිකරුවන්ට ලබාදීමට විකල්ප ඉඩම් හඳුනාගෙන තිබේද;

(iii) එසේනම්, එම ස්ථාන කවරේද;

(iv) විකල්ප ඉඩම් හඳුනා ගෙන නොමැතිනම් ඒවා ලබාදීමට කටයුතු කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0672/'08

15.

ගරු සමන්සිරි හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ගවලට අයත් සමස්ත වැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වැව් වලට අයත් රක්ෂිත ඉඩම් ප්‍රමාණය වෙන් වෙන්ව කොපමණද;

(iii) මෙම රක්ෂිත ඉඩම් හඳුනා ගැනීම සඳහා අවසන්වරට මිනුම් කටයුතු කර ඇති වර්ෂය කවරේද;

(iv) රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන් සිටීද;

(v) එසේනම්, ඔවුන් පදිංචි ව සිටින්නේ කිසියම් නෛතික තත්ත්වයක් තුළද;

(vi) අදාළ වර්ෂය, පදනම සහ කොපමණ කාලසීමාවක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රක්ෂිත ඉඩම්වල පදිංචිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සුළු වාරිමාර්ග හා මහ වාරිමාර්ග අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වැව් රක්ෂිතවල පදිංචිකරුවන්ට ලබාදීමට විකල්ප ඉඩම් හඳුනාගෙන තිබේද;

(iii) එසේනම්, එම ස්ථාන කවරේද;

(iv) විකල්ප ඉඩම් හඳුනා ගෙන නොමැතිනම් ඒවා ලබාදීමට කටයුතු කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. හා. 9.30 සිට අ. හා. 12.30 දක්වා ද, අ.හා. 1.00 සිට අ.හා. 4.30 දක්වා ද විය යුතු ය. අ. හා. 1.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2008 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. හා. 10.00 සිට අ.හා. 12.30 දක්වා ද, අ.හා. 1.00 සිට අ.හා. 4.30 දක්වා ද විය යුතු ය. අ. හා. 1.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2008 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා පූ.හා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

4.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය.

"ග්‍රාස්රූට්ස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 21 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජූනි මස 27 දිනැති අංක 1555/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*5.

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ඕ) සහ (ක) ඡේද යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2007 දෙසැම්බර් මස 17 දිනැති අංක 1528/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*6.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග (අංක 1),— 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වැනි වගන්තියේ දෙවැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2007 ජනවාරි මස 22 දිනැති අංක 1481/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*7.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග (අංක 2),—1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වැනි වගන්තියේ දෙවැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි මස 13 දිනැති අංක 1536/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

* 8.

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*9.

අධ්‍යාපන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 212— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් හාරසිය හතළිස් එක් මිලියන අටසිය දහසකට (රු. 441,800,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 212 | — | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන ක්‍රියාකාරකම් |

| | | |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | රු. | 441,800,000 |
| ප්‍රාග්ධන වියදම් | රු. | — |
| එකතුව | රු. | 441,800,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2008 අගෝස්තු මස 22 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 5 දක්වා එකතුව රුපියල් 15,070,180,332.

*10.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*11.

ජාතික මංමාවත් පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*12.

ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*15.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*19.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*20.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*21.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*22.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම" දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.<br>රු. | 1,000,000,000<br>680,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු.<br>රු. | 3,800,000,000<br>3,900,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු.<br>රු. | 400,000,000<br>550,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.08.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතුය.

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*26.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*27.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධුරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධුරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා නැවත එම ධුරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධුරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) ව්‍යවස්ථාව අනුව එස්. ස්වර්ණජෝති මහතා 2008.01.04 වැනි දින සිට විගණකාධිපති ධුරයට පත් කරන ලදුව, අනතුරුව විගණකාධිපති තනතුරට හිමි එස්එල්-4 රු. 47,515-12x1,425-64,615 වැටුප් ක්‍රමයේ රු.58,915 වැටුප් පියවරේ පිහිටුවීමට තීරණය කරන ලදී. ස්වර්ණජෝති මහතා ධුරය දරන තාක් කල් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් 2008.08.06 වැනි දින තීරණය කරන ලද හෙයින් විගණකාධිපති එස්. ස්වර්ණජෝති මහතාට 2008.01.04 වැනි දින සිට රු. 58,915ක මාසික වැටුපක් ගෙවීමට හා ධුරය දරන තාක් තනතුරට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14,400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*32.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*33.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*34.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |
| සාමාජිකයින් | | | | |
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

35.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

36.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.

විශේෂ අවශ්‍යතා සහිත වූ ළමයින් සඳහා වූ කෝසල දුල්ලැව පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.